<u>ජෙරාඩ් පෙරේරා නඩුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්ගේ දේශණය.</u>

<u>මහාධිකරණය - මීගමුව</u>

<u>2008.02.27</u>

<u>නඩු අංකය : එම්.සී.326/2003</u>

1 සිට 6 දක්වා චූදිතයන් සිටී. 1,2,3, සහ 6 විත්තිකරුවන් වෙනුවෙන් නීතීඥ සීළඳ ගමගේ මහතා සමඟ නීතීඥ ශානක රණසිංහ මහතා පෙනී සිටී.

4 සහ 5 විත්තිකරුවන් වෙනුවෙන් ප්‍රින්සි පෙරේරා මහතා පෙනී සිටී. අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් නීතීඥ බර්නාඩ් පීටර්සන් මහතා පෙනී සිටී. පැමිණිල්ල වෙනුවෙනු නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ශවින්ද්‍ර ප්‍රනාන්දු මහතා සමඟ රජයේ අධිනීතීඥ අනුෂා ද සිල්වා මෙනවිය පෙනී සිටී.

**නීතීඥ ශානක රණසිංහ මහතා කරුණු දක්වමින් :**

අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් උතුමියනි, ඔබතුමියගේ අධිකරණයේ ලිඛිත සැලකිරීමක් අගතියට පාර්ශ්වය වෙනුවෙන් කිරීමට ඉල්ලා සිටීමට අපේක්ෂා කරන බව මා හට දැනුම් දුන්නා. එවැනි අවස්ථාවක විත්තිකරුවන්ට අගතියක් සිදු වෙනවා අද දින විත්තිකරුවන්ගේ සැලකිරීම් ඉදිරිපත් කිරීමෙන් පසු යම් කිසි සැලකිරීමක් සිදුවුවහොත් (ඉංග්‍රීසියෙන් කරුණු දක්වා සිටී)

මේ අවස්ථාවේදී අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින නීතීඥ පීටර්සන් මහාත කරුණු දක්වමින් :

ගරු මැතිණියනි, අගතියට පත් පාර්ශ්වයන වෙනුවෙන් මගේ අවස්ථාවේදී මේ ඉල්ලීම කරන්නේ අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් මෙම නඩුව සම්බන්ධව කරුණු සැලකිරීමට ඔබතුමියගේ අවසරය පතනවා. ඒ අනුව ඒ සම්බන්ධව ඔබතුමියගේ ගරු අධිකරණයට ලිඛිත සැල කිරිමක් ඉදිරිපත් කිරීමට ඉතාමත් කෙටි කාලයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් ගෞරව පූර්වකව අයැද සිටිනවා.

**නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කරුණු දක්වමින් :**

පැමිණිල්ල වෙනුවෙන් මාගේ කිසිදු විරෝධතාවයක් නෑ. එවැනි සැල කිරිම් කිරීම හෝ එයට පිලිතුරු දීම සඳහා විත්තිය වෙනුවෙන් නීතීඥ මහතා අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් කරන ලිඛිත සැලකිරීම් වෙනුවේන එයට ප්‍රතිචාර දක්වනවාට. නමුත් අද දින මම සූදානම් මාගේ වාචික සැලකිරීම් දේශනය ඉදිරිපත් කරන්න. මා හිත ආකාරයට ඔබතුමිය විශේෂයෙන් ඉල්ලා සිටින්නේ නම් මිස වාචික සැලකිරීම්වලට අමතරව ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වන්නේ නෑ. ඒ අනුව අදට නියමිත පරිදි මාගේ පැමිණිල්ල වෙනුවෙන් දේශනය කිරිමට මාගේ අවස්ථාවක් දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**නීතීඥ ශානක රණසිංහ මහතා :**

මාගේ උගත් මිතුරා පවසා සිටින ආකාරයට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 203 වගන්තිය කෙරෙහි ඔබතුමියගේ ගරු අවධානය යොමු කරනවා. 203 වගන්තියේ උතුමියනි (කියවා සිටී) ජූරි සභාවක් නොමැතිව නඩු විභාගයක් පැවැත්වීමේදී විනිශ්චයකාරතුමා විසින් නඩු තීන්දුව දිය හැකිබව සඳහන් වෙනවා. එහිදී පැහැදිලි ව ම සඳහන් වන්නේ චෝදනා පක්ෂය හා විත්ති පක්ෂය වෙනුවෙන් කරුණු දැක්වීම අවසන් කරුනු ලැබූ විට එහෙම නම් උතුමියනි,

ඔබතුමියගේ ගරු අධිකරණය තීන්දුව ප්‍රකාශ කරන්නේ චෝදනා පක්ෂයේ සහ විත්ති පක්ෂයේ සැල කිරීම්වලින් පසුව. එයින් අදහස් වන්නේ විත්ති පක්ෂයට නඩුවේ සැලකිරීම් කිරීමට අවස්ථාව තිබෙන බවයි. මෙහි දී නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුමා සැලකිරීම් කිරීමෙන් පසුව මා සූදානම් මාගේ සැල කිරීම් 1,2,3, සහ 6 විත්තිකරුවන් වෙනුවේ හා 4,5 විත්තිකරුවන් වෙනුවේන මාගේ සැලකිරීම් කිරීමට. යම් කිසි විදිහකින් අගතියට පත් පාර්ශ්වයට කරුණු සැලකිරීමක් වුවහොත් වන්නේ විශාල අගතියක් විත්තිකරුවන්ට සිදු වෙනවා. එහෙම නම් යම් කිසි විදිහකින් ඔබතුමියගේ ගරු අධිකරණයේ ...................... (ඉංග්‍රීසියෙන් කරුණු දක්වයි)

**අධිකරණයෙන් ඃ**

මේ අවස්ථාවේදී නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුමාගේ දේශනයෙන් පසුව අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් ලිඛිත දේශනය ගොනු කිරිමට දිනයක් ලබා දෙමි. ඉන් අනතුරුව විත්තියේ දේශනය පැවැත්වීමටත් පාර්ශ්වකරුවන් එකඟතාවය සැලකර සිටි. එකඟතාවයේ පරිදි දින නියම කරමි. පැමිණිල්ල වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුමා දේශනය ආරම්භ කරමි.

**දේශනය**

ගරු උතුමියනි, ගරු නීතිපතිතුමා විසින් 1 සිට 6 දක්වා විත්තිකරුවන්ට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනාව නම් 1994 අංක 22 දරණ වධදීම් හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි ව සම්පුති පනතේ 2(4) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි. මෙවැනි නඩුවක් සම්බන්ධව සුවිශේෂී අත් දැකීම් ඇති ඔබතුමිය ඉදිරියේ මම නීතිය පිළිබඳ දීර්ඝ දේශනයක් කිරීමට බලාපොරොත්තු වන්නේ නෑ. නමුත් මෙම නඩුව ඔබතුමියගේ පූර්වභාග වීනිසුරුතුමා ඉදිරියේ ආරම්භ කොට එකී සාක්ෂි පිළි ගැනීම මත තවදුරටත් ඔබතුමිය ඉදිරියේ මේ නඩුව පවත්වාගෙන ගියා.

**වේලාව පෙ.ව.11.20 සිට**

**මෙතැන් සිට සටහන් ගැනීම එරංග දළුවත්ත මහාත විසින්**

**(ජේ.එම්.ටී.එම්.පී.යූ. තෙන්නකෝන්)**

**මහාධිකරණ විනිසුරු - මීගමුව.**

මහාධිකරණය - මීගමුව

මීගමුව මහාධිකරණ විනිසුරු ජේ.එම්.පී.යූ. තෙන්නකෝන් මැතිණිය ඉදිරිපිටදී ය.

සටහන් ගැනීම ඃ ලඝු ලේඛක වී. එරංග දළුවත්ත

දිනය ඃ 2008.02.27

නඩු අංකය ඃ එච්.සී. 326/03

වේලාව පෙරවරු 11.20

**නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුමාගේ දේශනය වැඩිදුරටත් ඃ**

පැමිණිල්ල විසින් මෙවැනි නඩුවක ඔප්පු කළ යුතතේ කුමක්ද යන්න වටහා ගැනීම සඳහා වධ හිංසා 1997 අංක 22 දරණ පනතින් කෙසේ අර්ථ නිරූපණය වන්නේ ද යන්න මදක් අවධානය යොමු කිරීම වැදගත් වෙනවා. ඒ අනුව එකී පනතේ 12 වෙනි වගන්තිය යටතේ වද දීම යුවෙන් (1997 අංක 22 දරණ පනතේ 12 වගන්තිය කියවා සිටී)

දෙවැන්න පසුව පැමිණිල්ල ඔප්පු කරන්න ඕන එම ක්‍රියාව සිදුකලේ රජයේ නිලධාරියෙක් හෝ නිල තත්ත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තෙකු විසින් , මෙම නඩුව විවාදයකින් තොරව පිළිගන්න පුළුවන් මෙම විත්තිකරුවන් පොලිස් නිලධාරීන් පැමිණිල්ල් සාක්ෂි සහ විත්තියේ සාක්ෂි දෙකෙන්ම ඔප්පු වනවා ඔවුන් රජයේ නිළධාරීන් බවත් ඔප්පු වෙනවා. පැමිණිල්ල් පළමුවන  කාර්යය වන්නේ දැඩි ශාරීරික හෝ මානසික වේදනාවක් ගෙනදෙන ක්‍රියාවක් සිදු කළා. ඒ ක්‍රියාව සිදුකලේ මේ හේතු තුනෙන් එකක් ප්‍රකාරව හෝ එවැනි ක්‍රියාවක් සිදුකිරීමේ පරමාර්ථයකින්. තුන එසේ සිදු කලේ රජයේ සේවකයන් බවත් මෙම කාරණා 03 පැමිණිල්ල සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරලා තිබෙනවා. පැමිණිල්ලට ඔබතුමිය ඉදිරියේ බය නැතිව ඉල්ලා සිටින්න පුළුවන්. මෙම නඩුව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බවත්, එබැවින් විත්තිකරුවන් වරද කරුවන් කරන ලෙසටත්. මෙම නඩුවේ සිද්ධිය ඉතා සැකෙවින් මා දක්වනවා නම් මා සාක්ෂි සම්බන්ධයෙන් වෙනම සඳහන් කරන්නම්. මේ සිද්ධිය සිදුවෙලා තිබෙන්නේ 2002.06.02 දා. මේ සිද්ධියේ පැමිණිල්ල කියන ආකාරයට වද හිංසාවට ලක්වෙලා තිබෙන්නේ ජේරාඩ් මර්වින් පෙරේරා. ඔහු අද ජීවතුන් අතර නෑ. නඩුවේ සාක්ෂිවලින් ඉදිරිපත් වෙලා තිබෙනවා එදින ඔහු ඩොක් යාර්ඩ් සමාගේ සේවයේ යෙදී සිට 12.00 පමණ වැඩ අවසන් වී නිවසට පැමිනීමට බස් රථයෙන් ඇවිල්ලා බස් රථයෙන් බසින අවස්ථවේදී පොලීසිය විසින් ඔහු අත්අඩංගුවට ගෙන තිබෙනවා. පොලීසිය විසිනුත් එම කරුනු පිළි අරගෙන තිබෙනවා. මෙම පොලිස් කණ්ඩායම පළමුවන විත්තිකරුගේ ප්‍රමුඛත්වයෙන් යුත් එම කණ්ඩායම ඔවුන් ත්‍රිත්ව මිනීමැරුමක් සම්බන්ධයෙන් සැකකරන පුද්ගලයෙක් හැටියට මෙම ජෙරාඩ් මර්වින් පෙරේරා පුද්ගලයාව අත්අඩංගුවට ගත්තා කියලා. පැමිණිල්ලෙන් කියන ආකාරයට ඊට ප්‍රථම ඔවුන් ඒ නිවසට ඇවිල්ලා ඔහු ඉන්නවාද කියලා සෝදිසි කරලා. ඔහු නෑ කිව්වට පස්සේ ඔහුගේ භාර්යාව වාහනයකට දමාගෙන බස් හෝල්ට් එකට ඇවිල්ලා ඒ අතරතුර පැමිණිලිකරුගේ මෙම සිද්ධියේ වධහිංසාවට ලක්වූ ජෙරාඩ් මර්වින් පෙරේරා ගේ බිරිඳගෙන් ලද දුරකථන අංකයක් මත ඔහු වැඩපොලෙන් 12.00 පමණ පිටවී ඇති බව සොයාගෙන එහි සිටින අවස්ථාවේ ඔහු එම ස්ථානයට පැමිණි බව සඳහන් වුනා. එම අවස්ථාවේ ඔහු බසයෙන් බැස කිසියම් ශරීර ආබාධයක් නොමැතිව සිටි බවත්, පැමිණිල්ල

සාක්ෂි ඉදිරිපත් කර තිබෙනවා. ඊට ප්‍රථම ඔහු ගෙදරින් රැකියාවක් සඳහා යන අවස්ථාවේදී කිසිම ශරීර ආබාධයක් හෝ රෝගී තත්ත්වයක් නොතිබූ බවත් සඳහන් වෙනවා. ඉන් පසු ඔහු අත්අඩංගුවට අරගෙන ඔහුව වාහනයේ දමාගෙන ගිය බවත් එය පොලිස් රථයක් බව නොදැන සිටි නිසා කළබලයට පත්ව පසුව වත්තල පොලිස් ස්ථානයේ සිටි බව දැනගෙන තිබෙනවා. ඒ පිළිබඳව ඔහුගේ සහෝදරයෙක් ගිහිල්ලා පොලීසියේ සොයලා බලලා ඔහු සිටින බවත් ඔහුට සිද්ධාලේප ගාමින් සිටි බවත් ඔහුට ඇවිදගන්න බැරි තත්ත්වයක සිටි බවත් සඳහන් වෙනවා. පසු දින ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්ගෙත් උපකාර ඇතිව පොලීසියට ගොස් මේ ත්‍රීත්ව මිනීමැරුමට පෙර දින සැක පිට අත්අඩංගුවට ගත් පුද්ගලයාව අධිකරණයට ඉදිරිපත් කිරීමකින් තොරව පොලිස් ඇප මත ඔහුව නිදහස් කර ගැනීමට හැකිවූ බව සාක්ෂි වල සඳහන් වෙනවා. මෙම අවස්ථාවේදී පැමිණිල්ලේ සාක්ෂිකරුවන් පැහැදිළිව සාක්ෂි දීලා තිබෙනවා ඔහු පොලීසියෙන් එලියට එන අවස්ථාවේදී ඔහු කලින් දවසේ සිටි තත්තිවයට වඩා වෙනස් තත්ත්වයක සිටියේ කියලා. ඔහුගේ මූණ ඉදිමිලා අත්දෙපසට කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා කෙලින් ඇවිද ගන්න බැරි තත්ත්වයකට පත්වෙලා හිටියෙ. මෙම හේතුව නිසා ළඟ තිබුණු ආයූර්වේද රෝහලකට ගෙනයන ලද නමුත් එහි ප්‍රතිකාර කිරීමට නොහැකි බවත් මොහුට අභ්‍යන්තර තුවාල තිබිය හැකි බැවින් ඇඟ ඉදිමීම් තිබෙන බැවින් වහාම නවලෝක වැනි ආරෝග්‍යශාලාවකට ඇතුලත් කළ බවත් එහි ප්‍රතිකාර ලබමින් සිට එහිදී හදිසි සැත්කම් ඒකකයට ඇතුලත් කර අසාධ්‍ය තත්ත්වයෙන් පසුවී ඉන්පසුව ජාතික රෝහලට ඇතුලත් කර ඉන් පසු ගෙදර නැවතී සුව තත්ත්වයක් ලැබෙනකම් ඔහු සිටි බවත් සඳහන් වෙලා තිබෙනවා.

ඊට අමතරව චූදිත මාස 3 ක පමණ කාලයක් මේ හේතුවෙන් රැකියාවට යාමට නොහැකි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඉන් පසුව මෙම නඩුවේ අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම නඩුවේ සාක්ෂිකරුවන් මෙම ජෙරාල් සාක්ෂි දීමට අධිකරණය නොතිසි යැවීමෙන් පසුව දින කිහිපයකින් බස් රථයක ගමන් කරමින් සිටින විට ඝාතනය කර තිබෙනවා. ඒ සියල්ල සාක්ෂි මගින් තහවුරු වෙනවා. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුවන්නේ මොහු මේ සිද්ධියේ දී අධික වේදනාවකින් ශාරීරික සහ මානසික වේදනාවකින් ගෙන දුන් බවට ඔප්පු වෙනවා. ගරු මැතිනියනි, ජෙරාල් පැහැදිලිව සඳහන් කර තිබෙනවා එම සිද්ධිය සිද්ධ වූ

දිනයේ ඔහු රැකියාවට පිටව ගිය අවස්ථාවේ කිසිදු ශාරීරික ආබාධයකින් හෝ මානසික ආබාධයකින් අසනීප තත්ත්වයක් තිබුණේ නෑ. ඔහු පසුදින බස් රථයකින් බැහැලා එන අවස්ථාවේ ඔහුට කිසිදු අසනීපයක් හෝ ශාරීරික හෝ මානසික අබාධයකින් නැති බවට සාක්ෂිවලින් පැහැදිලිව ඔප්පු වෙනවා පොලීසියේ මෙම සිද්ධිය පිළිබඳව පොලිස් මූලස්ථානයෙන් මෙම කණ්ඩයාම 1 සිට 6 වන විත්තිකරු දක්වා කණ්ඩායම විසින් මෙම පුද්ගලයා අත්අඩංගුවට ගත් බව ඔවුනගේ සාක්ෂිවලින් පිලි අරගෙන තිබෙනවා. මෙම අවස්ථාවේ චූදිත කිසිදු ශාරීරික ආබාධයකින් නොමැති බවට අවබෝධ වෙලා තිබෙනවා. නමුත් 1,2,3, විත්තිකරුවන් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ චූදිත අත්අඩංගුවට ගැනීමේදී අවම බලය යෙදූ බවට සඳහන් කරනවා. මේ අවම බලය සම්බන්ධයෙන් 1,2,3, විත්තිකරුවන් විත්ති කූඩුවේ සිට ප්‍රකාශ කර ඇතත් 4,5,6 විත්තිකරුවන් ප්‍රකාශ කරලා නැහැ. පොලීසියේ ඇති පොත්පත් වල අවම බලය යෙදූ බවට සඳහන් වෙලා තිබෙනවා. 1 විත්තිකරු විසින්. විත්තියේ කියන ආකාරයට අවම බලය යෙදීමට සිද්ධ වුනේ මේ හයදෙනා මෙම පුද්ගලයා අත්අඩංගුවට ගත් පසුව ඔවුන් පොලීසියට යන අතරතුර දී තේ බොන්න වාහනයේ දොර ඇරපු අවස්ථාවේ පාර දිගේ දුවන අවස්ථාවේ වැටී වැටී දුවන අවස්ථාවේ අවම බලය යොදා ඔහු අත්අඩංගුවට ගත්තා. නමුත් අත්අඩංගුවට ගැනීමේදී මෙම බලය යෙදීම පොලීසියට පැමිණීමෙන් පසුව උප සේවයට භාර දීමේදී පවා එවැන්නක් උපසේවයේ හිටපු පොලිස් සැරයන්වරයාට දැන්වීමක් කර නැහැ. අපරාධ අංශයේ විත්තියෙන් කැඳවූ පොලිස් පරීක්ෂකතුමා පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ඉගෙන ගෙන තිබෙනවා. විත්තියේ සාක්ෂිකරුවන් එවැනි අවම බලයක් යෙදීම උපසේවයට දැන්වීමට අවශ්‍ය බව කියා සිටිනවා. නමුත් විත්තියෙන් කැඳ වූ උප සේවයට භාර ගත්ත පොලිස් නිලධාරියා කියන්නේ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ඉගැන්වූවේ නෑ කියලා. පැමිණිල්ලෙන් කියා සිටිනවා මෙම විත්තිකරු විසින් විත්ති වාචිකය ලෙෂ හරස් ප්‍රශ්න ඇසීමේදී ඔවුන් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශ වල මෙලෙෂ සඳහන් වෙනවා. 6 දෙනෙකුගෙන් යුත් පුද්ගලයන් පිරිසක් මගින් වැඩට ගොස් හොර බඩු ගෙනමින් සිටි පෙරාල් අත්අඩංගුවට ගත් පසුව තේ බීම සඳහා පොලීසියට පැමිණීමට පෙර කඩයක් අසල නැවැත්වූ අවස්ථාවේ පලායාමට තැත් කළ අවස්ථාවේ වැටිවැටී දුවද්දී ඔහු මෙලෙෂ මෙල්ල කිරීමට ප්‍රබල පිරිසක් අවම බලය යෙදීම හාස්‍යයට ලක්වන කථාවක් බවට ඔබතුමියගෙන් ගරු අවධානය යොමු

කරනවා. දැන් මෙම සිද්ධියෙන් ජෙරාල් අවාසනාවන්ත ලෙෂ බස් රථයේදී වෙඩි කෑ බවට මේ අධිකරණයේ සාක්ෂියක් ඉදිරිපත් කරන්න හැකියාවක් නෑ. නමුත් ඔවුන් විසින් මිය යාමට ප්‍රථම මූලික අයිතිවාසිකම් නඩුවක් දමා තිබෙනවා. කෙසේ හෝ ඔහුගේ ශරීරයේ තිබුන තුවාල සම්බන්ධයෙන් අධිකරණය වෛද්‍ය නිලධාරියෙක් සහ අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂ දැනුමක් සුවිශේෂ දැනුමක් මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා සාක්ෂි දුන්නා. ඔහුගේ තුවාලය මේ අවස්ථාවේ එකින් එක විස්තර කිරීම අවශ්‍ය නෑ. වැදගත් කරුණ වන්නේ ඔහුට අධික ලෙෂ තුවාල සිදු වෙලා තිබෙනවා. තුවාලවලට බෙහෙත් කිරීමේදී වෛද්‍යවරයා වොලිබිට් නැමැති ඖෂධය දුන්නා. විශේෂඥ වෛද්‍යවරයා සඳහන් කර තිබෙනවා මහාචාර්යතුමා සඳහන් කරනව සුළු රිදීමක් තිබෙනවා නම් පැනඩෝල් ඩිස්ප්‍රීන් වැනි ඖෂධයක් දෙන බවත්, අධික වේදනාවෙන් පෙලනවා නම් පමණක් ඩොලයිඩ් ඖෂධය ලබාදෙන බවත්. ගරු මැතිනියනි, තුවාලවලට ඔහුට ලබා දුන් ප්‍රතිකාර සඳහා ලබාදුන් ඖෂධ අනුව එම පුද්ගලයා අධික වේදනාවකින් මෙම තුවාල නිසා පෙලුන බව මනාවට ඔප්පු වෙනවා. ඔහු පොලිස් අත්අඩංගුවට පත් වූ අවස්ථාවේ සිට එම ග්‍රහණයෙන් මිදී පොලීසියෙන් කියන ආකාරයට පොලිස් ඇප මත නිදහස් කිරීම තුළින් කෲර වධ හිංසා කළ බවට පැහැදිලි වෙනවා. මෙවැනි ත්‍රිත්ව මිනීමැරුමක් පිළිබඳව පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහු මෙම නඩුවේ සාක්ෂි දුන ඔහුගේ සාක්ෂිවලට සම්බන්ධ යම් යම් සැල කිරීම් කිරීමේදී සුරවීර පවා කිව්වා මොහු නිදහස් කර හැරියේ කිසිදු සම්බන්ධයක් නැති නිසා කියලා. නමුත් ත්‍රිත්ව මිනි මැරුමක් නිසා සොරකම් කිරීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන පැය 24 ක් තුළදී එම පුද්ගලයා අධිකරණයට ඉදිරිපත් කිරීමකින් තොරව පොලිස් ඇප මත මුදාහැරීමේ සිද්ධියක් සිදු වන්නේ නැ. ඒ වගේම පැමිණිල්ලේ හරස් ප්‍රශ්නවලදී විත්තිකරුගෙන් පැය 24 ක් තුළදී පොලිස් විමර්ෂණය සිදු කර තිබෙනවා. ඒවා මනාවට ඔප්පු වෙනවා. මෙම ජෙරාල් සැකපිට අත්අඩංගුවට ගත්තා නම් ඒ සැකය දුරු කර ගැනීම සඳහා අවශ්‍ය විමර්ෂණයක් පැය 24 ක් තුළදී සිදු කරලා නැහැ. එසේ නම් ත්‍රිත්ව මිනිමැරුමට සම්බන්ධ පුද්ගලයෙක් සැක පිට අත්අඩංගුවට ගෙන සැකකරු පොලීසිය විසින් පැය 24 කින් නිදහස් කර තිබෙනවා.

පැමිණිල්ල විත්තිය වෙනුවෙන් සාක්ෂි දුන පොලිස් පරීක්ෂක සුරවීර මහතාට යෝජනා කර සිටියා මොහු කලින් පොලීසියේ සිටින විට වධ හිංසාවට ලක් වූ අසාද්‍ය තත්ත්වයට ලක් වූ ජෙරාඩ් මර්වින්  පෙරේරා අහිංසක පුද්ගලයෙක් බව දන දන එම පුද්ගලයාට වද හිංසාවක් සිදු වූ බවට ඒත්තු ගැන්වීමෙන් පසුව ඔහු ඒ පිළිබඳව පොලීසිය කරදරයට පත් වෙයි කියලා. ත්‍රිත්ව මිනි මැරුමකට සැකපිට අත් අඩංගුවට ගත් පුද්ගලයෙක් පැය 24 ඇතුලත අධිකරණයට ඉදිරිපත් කිරීමකින් තොරව මුදා හැරීම ඒ පිලිබඳව ඔහුගේ සැකය ස්ථිර වෙනවා. කිසිම පරීක්ෂණයකින් තොරව ඔහුව නිදහස් කර හැරියා. ඉන් පසුව මෙතන වැදගත් වන්නේ මේ කාලය තුළ දී මොහු ව මද හිංසාවට ලක් කරේ කවුද කියලා. ගරු මැතිණියනි, මෙතැන වැදගත් වෙන කරුණු කීපයක්ම තිබෙනවා. මේක වත්තල පොලීසිය මගින් සිදු කරපු විමර්ෂණය පරීක්ෂණයකින් නොවෙයි. සුරවීර මහතා පැහැදිළිවම ප්‍රකාශ කර තිබෙන්නේ ඔහු යටතේ සිදු වූ පරීක්ෂණයකින් නොවෙයි. මේ විශේෂ කණ්ඩායමක් විසින් ඒ විශේෂ කණ්ඩායම සඳහා 1 විත්තිකරු වන සුරේෂ් ප්‍රමුඛ කණ්ඩායමක් ඔවුන් විසින් වත්තල පොලීසියේ උපදෙස් මත නොවෙයි ඒ විශේෂ උපදෙස් මත සිදු කරනු පරීක්ෂණයක් කියලා. සුරවීර මහතාගේ සාක්ෂි දෙමින් සඳහන් කර සිටියා මට බලය තිබුණේ නෑ නිදහස් කරන්න. මෙවැනි සිද්ධියන් සම්බන්ධව විශේෂ කණ්ඩායමක් අත්අඩංගුවට ගත්තේ. ඔහුගෙන් ප්‍රශ්න කරන්න පුළුවන් විශේෂ කන්ඩායමට. ඔහුව නිදහස් කරන්න පුළුවන් ඒ විහේෂ කණ්ඩායමට විතරයි. ඒ නිසා ඒ එස් පී මහත්යගෙන් අහල නිදහස් කරන්න කියලා උපදෙස් දුන්නා. විශේෂ කණ්ඩයාම මගින් අත්අඩංගුවට ගත් මෙම පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා කිරීමක් වත්තල පොලිස් ස්ථානයෙන් කිසි කෙනෙකු විසින් සිදු කිරීමට නොහැකියි. එසේ නම් එය කළ හැක්කේ මෙම කණ්ඩායමේ අය විසින් පමණයි. එම කණ්ඩායම විසින් එම කණ්ඩායමට අඩංගු 1,2,3 විත්තිකරුවන් අතුළු කන්ඩායමක් විසින් ජෙරාඩ් මර්වින් පෙරේරා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවවට පටහැනිව කෲර වධ හිංසාවට ලක් වී තිබෙනවා. ඒ වෙන ස්ථානයක් නොවෙයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ පිළිබඳව විනිශ්චයන් ලබා දී තිබෙනවා. මම ඔබතුමියගෙන් ඒ සඳහාම විත්ති කූඩුවේ සිට විත්තිකරුවන් වරදකරු කළ යුතු යි කියලා. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලි විනිශ්චයකට පැමිණිලා තිබෙනවා ජෙරාඩ් මර්වින් පෙරේරා වධ හිංසාවට ලක් වුනා කියලා. පැමිණිල්ල සාක්ෂි මගින් ඔප්පු කර තිබෙනවා ඒ ජෙරාඩ් මර්වින් පෙරේරා අත්අඩංගුවට ගන්න ප්‍රථම කිසිදු ලෙඩක්

ආබාධයක් තිබුණේ නෑ කියලා. ඒත් අත්අඩංගුවට ගත්ත ජෙරාඩ් මර්වින් පෙරේරා අත්අඩංගුවට ගෙන පැය 24 ට අඩු කාලයක් සිට එලියට එනකොට තමයි කෲර වධහිංසාවට ලක් වී තිබුණේ. මේ විත්තියේ සාක්ෂිවලින් පිලි අරගෙන තිබෙනවා විශේෂ කණ්ඩායම විසින් අත්අඩංගුවට ගත් මේ පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු ආකාරයකින් ක්‍රියා කිරීමට එකී කණ්ඩායම හැරෙන්නට වත්තල පොලීසියේ වෙනත් කිසිවෙකුට හැකියාවක් නොමැති බවයි. පොලිස් නිලධාරියෙක් ඉදිරිපත් කරා විත්තිය විසින්. ඔහු අවුරුදු 18 සේවය කර තිබෙනවා කිසිදු දිනයක ඔහු කිසිදු කෙනෙකුට පහර දෙනවා කියලා අහලා නෑ. ඒ වගේ සාක්ෂි තමයි විත්තිය ඉදිරිපත් කරේ. මෙම අත්අඩංගුවට ගත් ජෙරාඩ් මර්වින් පෙරේරා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ හැකියාව තිබෙනවා. ඊට අමතරව කණ්ඩායම විසින් අත් අඩංගුවට පොලිස් අත්අඩංගුවේ සිටි සුළු කාල වේලාව ඇතුලත තමයි මෙම වධහිංසාවට ලක් වුණේ. ඇත්ත වශයෙන්ම පොලීසියේ සිටි එම වේලාව සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි තිබෙනවා. ඊට අමතරව ඔහු ඉන්න කාලය තුළ දී සහෝදරයෙක් බලන්න යනකොට ඔහු කුඩුවේ සිටියේ නෑ. ඊට පසුසේ ඔහුව අත් දෙකෙන් අල්ලා ගෙන අමාරුවෙන් ගෙනමින් තියෙනවා. මේ කරුණු අනුව පැහැදිලිවම පැමිණිල්ල ඔප්පු කර තිබනවා ජෙරාඩ් මර්වින් පෙරේරා සම්බන්ධයෙන් එනම් එමම නඩුවේ දැනට මියගොස් සිටින පුද්ගලයා වධහිංසාවට ලක්වී තිබෙන බව. ඒ ලක්වුනේ 1 සිට 6 දරණ විත්තිකරුවන් විසින් සමන්විත වූ කණ්ඩායම විසින් අත්අඩංගුවට ගෙන පැය 24 කාලය තුළ පොලීසියෙන් මුදාහරින අතර කාලය තුළ දී කියලා පැහැදිලි සාක්ෂි තිබෙනවා. විත්තියේ සාක්ෂිවලින් පැහැදිලි වෙනවා මෙම කන්ඩායාම විශේෂ කණ්ඩායමක්. වත්තල පොලීසියේ පරිපලානයට අනුයුක්ත කරලා තිබුණ. විශේෂ කණ්ඩායමක් පරීක්ෂණ කටයුතු කරන බවත්. ඔහු මෙම අත්අඩංගුවට ගත් ජෙරාඩ් මර්වින් පෙරේරාගෙන් ප්‍රශ්න කිරීමට වත්තල පොලීසියේ වෙනත් කිසිවකුට හැකියාවක් නැති බව . පොලීසියෙන් අත්අඩංගුවට ගත් පසු වධහිංසාවට ලක්වුණේ වෙනත් අයගෙන් නොව මෙමම 1 සිට 6 වෙනි විත්තිකරුවන් මෙම පැමිණිල්ල විසින් ඔප්පු කර ඇති බව පැමිණිල්ල ඔබතුමියගේ අවධානයට යොමු කරනවා. මේ සම්බන්ධයෙන් විත්තිය දක්වූ ප්‍රතිචාරය හාස්‍ය ජනකයි. ඔහු අත්අඩංගුවට ගත්තා. ඒ තේ බොන්න යන කොට පලා යන්න හැදුවා. වැටි වැටී දිව්වා. අවශ්‍ය නෑ කියලා කිව්වා. උප සේවයට භාර දුන්නා. 1,2,3 විත්තිකරුවන් ඔවුන් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබූ බැවින් හා ඔවුන් එම නඩුවල දිවුරුම් පෙත්සම්

මගින් ඒ අවම බලය කතාව කියා තිබෙනවා. 4,5, 6 විත්ති කරුවන් විසින් ඒ නඩුවේ වගඋත්තරකරුවන් කර නොමැති බැවින් ඔවුන් ඒ කණ්ඩායමේ එම වැටලීම්වලට සහභාගී වෙලා ඔවුනුත් එම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව සඳහන් කර සිටියත් 1,2,3 විත්තිකරුවන් කියන වැටි වැටි දිවීම හෝ අවම බලය යොදා අත් අඩංගුවට ගෙන තිබූ බව ඒ 4,5,6 විත්තිකරුවන් විසින් සනාථ කරන්නේ නැහැ.

ඔබතුමිය දන්නවා නෛතික තත්ත්වය යටතේ එවැනි නඩුවක විත්තිකරුවන් තමුන් බොරු තත්ත්වයක් ගෙනහැර පැමට උත්සාහ ගන්නේ නම් එය විත්තිකරුවන්ගේ අගතියට හේතු වන කරුණක් නියා සඳහන් කරනවා. පොලිස් අත්අඩංගුවේ මෙ පමණ සුළු කාලයක් තුළ මෙවැනි ලොකු වෙනස් වීමක් ශාරීරික තත්ත්වයෙන් ඇති වූනේ ඇයිද යන්න පැහැදිළි කිරිමට අපොහොසත් වීමෙන් නැවත එඩිම්බරෙෝ සිද්ධාන්තය වන ඔවුන්ට විරුද්ධව බරපතල නඩුවක් ඔප්පු කර තිබෙන අවස්ථාවකදී. පළමුව පැමිණිල්ල ඔප්පු කළා වධහිංසාවට ලක්වුනා. ඒ කාලයේ සිටියේ වත්තල පොලීසියේ වුවද ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය තිබුනේ මේ විත්තිකරුවනට පමණයි. එම නිසා එම වධහිංසාවට ලක්වුනේ මෙම අයගෙන් කියන එක පැමිණිල්ලේ සාක්ෂි මගින් ඔප්පු කර තිබෙනවා. එයට අමතරව මෙසේ සිදුකළ ක්‍රියාව මිනී මැරුමක් සම්බන්ධයෙන් සැකකරුවෙක් වශයෙන් ගත්තා නම් එම තැනැත්තාගෙන් තොරතුරක් ලබා ගැනීම පිණිස වෙන්න ඕන. නැති නම් වෙනත් තැනැත්තෙකු සිදුකරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් සැක කිරීම සම්බන්ධයෙන් වෙන්න ඕන. මෙම පුද්ගලයා අත්අඩංගුවට ගත්තේ ත්‍රිත්ව මිනීමැරුමක් සම්බන්ධයෙන් සැක කළ පුද්ගලයා වශයෙන්. ඒ සුලු කාලය තුළ ඔහුගෙන් ප්‍රකාශ සටහන් කරගත් බවද සඳහන් වනවා. අනිවාර්යයෙන්ම එසේ පහර දීමක් සිදුකර තිබෙන්නේ පාපොච්ඡාරණයක් ලබා ගැනීම සඳහා නැතිනම් අර ත්‍රිත්ව මිනී මැරුම සිදුකිරීමේ සැක කිරීම සම්බන්ධයෙන්. එහෙයින් ඔහුට අධික ශාරීරික හෝ මානසික පීඩාවක් සිදුවුණු බවත්, හෝ එසේ කළේ මෙම විත්තිකරුවන් බවත්. 1994 අංක 22 දරන පනතේ 12 වන වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදුකර ඇති බවට පැමිණිල්ල සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බවට මම කියා සිටිනවා. මෙම නැඩුවේ සාක්ෂි මත විත්තිකරුවන් සියලු

දෙනා එම අධිචෝදනාවේ වරදට වරදකරුවන් කරන ලෙසට ඉල්ලා මගේ දේශනය අවසන් කරනවා'

අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් ලිඛිත දේශන ගොනු කරන්නේ නම් මීළඟ දිනට පෙරාතුව කළ යුතුය. එය මෝසමක් මගින් සිදුකළ යුතු අතර පිටපත් නිත්තියේ නීතීඥ මහත්වරුන්ට නිකුත් කළ යුතුය. 01,02,03,06 විත්තිකරුවන් වෙනුවෙන් නීතීඥ ශානක රණසිංහ මහතාටත්, 04,05 විත්තිකරුවන් වෙනුවෙන් නීතීඥ ප්‍රින්ස් පෙරේරා මහතාටත් පිටපත් භාරදිය යුතුය. විත්තියේ දේශන මාර්තු 17 දිනට නියම කරන බැවින් අගතියට පත් පාර්ශ්වය විසින් දේශන මාර්තු 10 වන දිනට හෝ ඊට පෙරාතුව අධිකරණයේ ගොනු කළ යුතු අතර, විත්තියේ නීතීඥ මහත්වරුන්ට ද නිකුත් කළ යුතුය. අද දින සටහන් නියමිත ගාස්තු මත විත්තියට සහ අගතියට පත් පාර්ශ්වයට නිකුත් කරන්න.

**(ජේ.එම්.ටී.එම්.පී.යූ. තෙන්නකෝන්)**

**මහාධිකරණ විනිසුරු - මීගමුව.**

**2008.02.27**